නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මාසම්බුද්ධස්ස !!!

# සීලානුස්සති භාවනාව

**ශීලයෙහි ප්‍රභේද**

**1.** සසර කතරින් එතෙර වී ශාන්ත නිවන් සුවය ලබනු පිණිස බුදු, පසේබුදු, මහරහතන් වහන්සේලා විසින් ආදරයෙන් පුරන ලද්ද වූ මේ ශීලය වනාහි චේතනා-සීල, චේතසික-සීල (චෛතසික ශීලය), සංවර-සීල, අවිතික්කම-සීල නමින් සතරාකාර වන්නේ ය.

**2.** ප්‍රාණඝාතාදි සප්ත අකුසල කර්මපථයෙන් දුරුවීමේ දී පහළ වන්නා වූ සප්ත කුසල කර්මපථ චේතනාව ද, බුද්ධෝපස්ථානාදි ශාසනික වත්, පිළිවෙත් පිරීමේ චේතනාව ද චේතනා-සීල නම් වන්නේ ය.

**3.** ප්‍රාණඝාතාදි පාපයෙන් වැළකීමේ දී පහළ වන්නා වූ සම්මාවාචා - සම්මාකම්මන්ත - සම්මාආජීව නම් වූ විරති චෛතසිකයෝ ද, අනභිජ්ඣා, අව්‍යාපාද, සම්මාදිට්ඨි හෙවත් අලෝභ, අදෝස, අමෝහ නම් වූ කුසල මූලයෝ ද චෛතසික-සීල නම් වන්නේ ය.

**4.** සංවර-සීලය වනාහි ප්‍රාතිමෝක්ෂ-සංවරය, සති-සංවරය, ඤාණ-සංවරය, ඛන්ති-සංවරය, විරිය-සංවරය වශයෙන් පස් ආකාර වන්නේ ය.

**5.** ශික්ෂාපද ශීලය වනාහි ප්‍රාතිමෝක්ෂ-සංවරය නම් වන්නේ ය. චක්ඛු, සෝත, ඝාන, ජිව්හා, කාය, මන නම් වූ ඉන්‍ද්‍රියයන් සතියෙන් ආරක්ෂා කිරීම වනාහි ඉන්‍ද්‍රිය-සංවර නම් වන්නේ ය.

**6.** සතර මාර්ග ප්‍රඥාව සහ සිව්පස ප්‍රත්‍යවේක්ෂා ඥානය වනාහි ඤාණ-සංවර නම් වන්නේ ය.

**7.** ශීත - උෂ්ණ - සා - පිපාසා ඉවසීම ද, මැසි - මදුරු - අවු - වැසි - සුළං - විසකුරු සර්පාදීන්ගේ ස්පර්ශය ඉවසීම ද, නො මනා කොට කියන ලද නින්ද අපහාස චෝදනා පරුපවාද වචන ඉවසීම ද, දැඩි වූ තියුණු වූ කටුක වූ කෲර වූ ශාරීරික දුක් වේදනා ඉවසීම ද ඛන්ති-සංවර නම් වන්නේ ය.

**8.** උපන්නා වූ කාමවිතර්කය ද ව්‍යාපාදවිතර්කය ද විහිංසාවිතර්කය ද උපනුපන් ලාමක අකුසල පාපවිතර්කයන් ද නො ඉවසීම, පජහනය කිරීම, දුරු කිරීම, කෙළවර කිරීම, නැවත නූපදනාකාරයෙන් ප්‍රහාණය කිරීම ද විරිය-සංවර නම් වන්නේ ය.

**9.** මෙසේ සමාදන් වූ ශික්ෂාපද ශීලයේ වශයෙන්, සමාදන-විරති නම් වූ ද, පාපයක් කිරීමට එළඹ සිටි අවස්ථාවෙහි එයින් වැළකීම වශයෙන් සම්පත්ත-විරති නම් වූ ද, විරති ශීලය සහිත වූ සීල-සංවර, සති-සංවර, ඤාණ-සංවර, ඛන්ති-සංවර, විරිය-සංවර නම් වූ පඤ්චවිධ සංවරය වනාහි සංවර-සීල නම් වන්නේ ය.

**10.** සමාදන් වූ ශික්ෂාපද ශීලය, භෝග - යස - ඤාති - අංග - ජීවිත යන කවර කාරණයෙකින්වත් ව්‍යතික්‍රමණය නො කොට නො බිඳ ආරක්ෂා කිරීම වනාහි අවිතික්කම-සීල නම් වන්නේ ය.

**11.** ශීලවන්තයාගේ කාය, වාග් පැවතුම් පිළිබඳ සන්සුන් බව ද සමාධිගත සංවර බව ද ධ්‍යාන විදර්ශනා ආදි කුසල ධර්මයන්ට පිහිට වන බව ද ආධාර වන බව ද (සමාධාන-උපධාරණ) ශීලයෙහි ලක්ෂණය වේ. ඇසට ලක්වන රූප අරමුණ නිල්පාට, කහපාට ආදි වශයෙන් නොයෙක් ආකාර වන්නේ නමුත් ඇසට ලක්වීම නම් වූ සනිදර්ශන අර්ථයෙන් එකක් ම වන්නේ යම් සේ ද එසේම චේතනා සීල, චේතසික සීල, සංවර සීල, අවිතික්කම සීලය වශයෙන් නානා ප්‍රභේද වූ ද ශීලය හෙවත් කාය, වාග් සංවරය ධ්‍යාන විදර්ශනාදි උසස් කුසල ධර්මයන්ට ආධාර බව ය යි කියන ලද සීලන ලක්ෂණය ම ඇත්තේ ය.

**12.** උතුම් ශීල සම්පත්තිය වනාහි, දුශ්ශීල බව නැති කිරීම කෘත්‍ය රසය කොට ඇත්තේ ය. ලොවී-ලොව්තුරා උතුම් ගුණයනට පැමිණීම සම්පත්ති රසය ද කොට ඇත්තේ ය.

13. උතුම් ශීල සම්පත්තිය වනාහි කායසෝචෙය්‍ය, වචීසෝචෙය්‍ය, මනෝසෝචෙය්‍ය නම් වූ පිරිසිදු බව වැටහීම කොට ඇත්තේ ය. හිරි, ඔතප් දෙක වනාහි ශීලය සමාදනයට හා පැවැත්මට ආසන්න ම හේතුව වන්නේ ය.

14. ආනිසංස වශයෙන් විපිළිසර නො වීම හෙවත් නො පසුතැවීම ශීලයේ පළමුවැනි ආනිසංසය වන්නේ ය. තව ද ශීලවන්තයා අප්‍රමාදී බැවින් ධනවත් වීම ද, කීර්තිය යශස පැතිරී යාම ද, නිර්භය වීම ද, මරණාසන්නයේ දී සිහිනුවණින් යුක්ත වීම ද, ආයු කෙළවර සුගතිගාමී වීම ද ශීලානිසංස වන්නේ ය.

15. ශීලවන්තයා ආශ්‍රය කරන්නන්හට ප්‍රිය මනාප ගරු සම්භාවනීය වීම ද, ලාභ - සත්කාර - කීර්ති - ප්‍රශංසා ලාභී වීම ද, පූජා සත්කාර මහත්ඵල වීම ද, පරලෝ සැපත් ඥතීන්ට මහත් පින් අත්කරවීම ද, භය හා භයානක අරමුණු මැඩපැවැත්වීම ද, අරති-රති මැඩපැවැත්වීම ද, රූපාවචර ධ්‍යාන සමාපත්තිලාභී වීම ද, අරූපාවචර ධ්‍යාන සමාපත්තිලාභී වීම ද, පෙර විසූ කඳ පිළිවෙළ දන්නා නුවණ ලැබීම ද, දිවැස් නුවණ ලැබීම ද, සතර මග, සතර ඵල, නිවන ලැබීම ද ශීලයෙහි ආනිසංස වන්නේ ය.

16. ගංගා, යමුනා, අචිරවතී, සරභූ, මහී නම් වූ පංච මහා ගංගාවේ ජලයෙන් ධෝවනය කරන ලද්දේ නමුත් පිරිසිදු කළ නො හැකි වන කෙලෙස්මල වනාහි උතුම් ශීල ජලයෙන් සේදී සන්තානය පිරිසිදු වන්නේ ය.

17. සුදු සඳුන්, මුතු, මැණික්, සඳ කිරණ හා සිසිල් සුළඟින් ද නිවාලිය නො හැකි වන කෙලෙස් දහය වනාහි ආර්ය වූ අත්‍යන්ත ශීතල වූ ශීලයෙන් සන්සිඳෙන්නේ ය.

18. උඩු සුළඟෙහි ද යටි සුළඟෙහි ද සම ව හමායන සිල් සුවඳ හා සමාන වෙනත් සුවඳක් නම් නැත්තේ ම ය. ශීලය සමාන සුගතියට යන ඉනිමගක් ද නිවනට පිවිසෙන අන් දොරටුවක් ද නැත්තේ ම ය.

19. සූසැට අබරණ පැළඳගත් රජදරුවන්හට වැඩියෙන් සීලාභරණයෙන් සැරසීගත් ශීලවන්තයා බබළන්නේ ය.

20. ආත්මානුවාද භය - පරානුවාද භය - දණ්ඩ භය - දුර්ගති භය යනාදි සියලු භය සන්ත්‍රාසය විහත විද්වංසනය කොට මනා ව රක්නා ලද ශීලය වනාහි ශීලවන්තයාහට නිරාමිස ප්‍රීතිය ද සමාධිය ද ගෙන දෙන්නේ ය.

21. චාරිත්‍ර සීලය, වාරිත්‍ර සීලය, ආභිසමාචාරික සීලය, ආදිබ්‍රහ්මචරියක සීලය, විරති සීලය, අවිරති සීලය, නිශ්‍රිත සීලය, අනිශ්‍රිත සීලය, කාලපරියන්ත සීලය, ආපාණකෝටික සීලය, සපරියන්ත සීලය, අපරියන්ත සීලය, ලෞකික සීලය, ලෝකෝත්තර සීලය වශයෙන් ශීලය තුදුස් වැදෑරුම් ද වන්නේ ය.

22. හීන සීල, මජ්ඣිම (මධ්‍යම) සීල, පණීත සීල, අත්තාධිපතෙය්‍ය සීල, ලෝකාධිපතෙය්‍ය සීල, ධම්මාධිපතෙය්‍ය සීල, පරාමට්ඨ සීල, අපරාමට්ඨ සීල, පටිප්පස්සද්ධි සීල, විසුද්ධ සීල, අවිසුද්ධ සීල, වේමතික සීල, සේඛ සීල, අසේඛ සීල, නේවසේඛ-නාසේඛ සීලය වශයෙන් ශීලය පසළොස් වැදෑරුම් ද වන්නේ ය.

23. හානභාගිය සීල, ඨිතිභාගිය සීල, විසේසභාගිය සීල, නිබ්බේධභාගිය සීල, භික්ඛු සීල, භික්ඛුනී සීල, අනුපසම්පන්න සීල, ගහට්ඨ (ගෘහස්ථ) සීල, පකති (ප්‍රකෘත) සීල, ආචාර සීල, ධම්මතා (ධර්මතා) සීල, පුබ්බහේතුක සීල, පාතිමොක්ඛසංවර (ප්‍රාතිමෝක්ෂ සංවර) සීල, ඉන්ද්‍රියසංවර සීල, ආජීවපාරිසුද්ධි සීල, පච්චයසන්නිස්සිත (ප්‍රත්‍යයසන්නිශ්‍රිත) සීලය වශයෙන් ශීලය සොළොස් වැදෑරුම් ද වන්නේ ය.

24. පරියන්තපාරිසුද්ධි සීල, අපරියන්තපාරිසුද්ධි සීල, පරිපුණ්ණපාරිසුද්ධි සීල, අපරාමට්ඨපාරිසුද්ධි සීල, පටිප්පස්සද්ධිපාරිසුද්ධි සීල, පහාන (ප්‍රහාණ) සීල, වේරමණී සීල, චේතනා සිල, සංවර සීල, අවීතික්කම සීල වශයෙන් ශීලය දස වැදෑරුම් ද වන්නේ ය.

**<u>භාවනා වාක්‍ය:</u>**

**1.** සාධු**!** සාධු**!** අනන්තාපරිමාණ බුදු, පසේබුදු, මහරහතන් වහන්සේලා අනු ව යමින් මාර්ග, ඵල, නිවන් සුව පිණිස මා විසින් සමාදන් ව රක්නා ලද ශීලයෙහි පළමුවැනි සිකපදය ද බිඳී නැත්තේ ය. අන්තිම සිකපදය ද බිඳී නැත්තේ ය. මුලින් හෝ අගින් හෝ කඩ කපන ලද සළුවක් මෙන් නො වූ බැවින් මාගේ ශීලය 'අඛණ්ඩ'-ශීලයකි. 'අඛණ්ඩ' වූ මාගේ ශීලය වනාහි නිවැරදි ශීලයකි. ඍජු ශීලයකි. කුසල ශීලයකි. පිරිසිදු ශීලයකි. නිවැරදි වූ ඍජු වූ කුසල් වූ පිරිසිදු වූ මාගේ ශීලය උපචාර සමාධි, අර්පණා සමාධි, මාර්ග-ඵල සමාධි දක්වා ආනිසංස ඵල ගෙන දීමට සමර්ථ වන්නේ ය. සාධු**!** සාධු**!** සාධු**!**

**2.** සාධු**!** සාධු**!** අනන්තාපරිමාණ බුදු, පසේබුදු, මහරහතන් වහන්සේලා අනු ව යමින් මාර්ග, ඵල, නිවන් සුව පිණිස මා විසින් සමාදන් ව රක්නා ලද ශීලයෙහි මැද සිකපදයක් ද බිඳී නැත්තේ ය. මැදින් සිදුරු වූ සළුවක් මෙන් නො වූ බැවින් මාගේ ශීලය 'අච්ඡිද්ද' ශීලයකි. 'අච්ඡිද්ද' වූ මාගේ ශීලය වනාහි, නිවැරදි ශීලයකි. ඍජු ශීලයකි. කුසල ශීලයකි. පිරිසිදු ශීලයකි. නිවැරදි වූ ඍජු වූ කුසල් වූ පිරිසිදු වූ මාගේ ශීලය උපචාර සමාධි, අර්පණා සමාධි, මාර්ග-ඵල සමාධි දක්වා ආනිසංස ඵල ගෙන දීමට සමර්ථ වන්නේ ය. සාධු**!** සාධු**!** සාධු**!**

**3.** සාධු**!** සාධු**!** අනන්තාපරිමාණ බුදු, පසේබුදු, මහරහතන් වහන්සේලා අනු ව යමින් මාර්ග, ඵල, නිවන් සුව පිණිස මා විසින් සමාදන් ව රක්නා ලද ශීලයෙහි, පිළිවෙළින් සිකපද දෙක, තුන බැගින් බිඳී නැත්තේ ය. පිටෙහි හෝ බඩෙහි හෝ කලු, රතු මිශ්‍ර එළදෙනකගේ කබර මෙන් නො වූ බැවින් මාගේ ශීලය 'අසබල' ශීලයකි. 'අසබල' වූ මාගේ ශීලය වනාහි, නිවැරදි ශීලයකි. ඍජු ශීලයකි. කුසල ශීලයකි. පිරිසිදු ශීලයකි. නිවැරදි වූ ඍජු වූ කුසල් වූ පිරිසිදු වූ මාගේ ශීලය උපචාර සමාධි, අර්පණා සමාධි, මාර්ග-ඵල සමාධි දක්වා ආනිසංස ඵල ගෙන දීමට සමර්ථ වන්නේ ය. සාධු**!** සාධු**!** සාධු**!**

**4.** සාධු**!** සාධු**!** අනන්තාපරිමාණ බුදු, පසේබුදු, මහරහතන් වහන්සේලා අනු ව යමින් මාර්ග, ඵල, නිවන් සුව පිණිස මා විසින් සමාදන් ව රක්නා ලද ශීලයෙහි, තැනින් තැන එක එක සිකපද බිඳී නැත්තේ ය. තැන් තැන්වල පුල්ලි විසිරී ගිය එළදෙනකගේ මෙන් පුල්ලි නැති බැවින් මාගේ ශීලය 'අකම්මාස' ශීලයකි. 'අකම්මාස' වූ මාගේ ශීලය වනාහි, නිවැරදි ශීලයකි. ඍජු ශීලයකි. කුසල ශීලයකි. පිරිසිදු ශීලයකි. නිවැරදි වූ ඍජු වූ කුසල් වූ පිරිසිදු වූ මාගේ ශීලය උපචාර සමාධි, අර්පණා සමාධි, මාර්ග-ඵල සමාධි දක්වා ආනිසංස ඵල ගෙන දීමට සමර්ථ වන්නේ ය. සාධු**!** සාධු**!** සාධු**!**

**5.** සාධු**!** සාධු**!** අනන්තාපරිමාණ බුදු, පසේබුදු, මහරහතන් වහන්සේලා අනු ව යමින් මාර්ග, ඵල, නිවන් සුව පිණිස මා විසින් සමාදන් ව රක්නා ලද ශීලය ලාභ, සත්කාර, කීර්ති, ප්‍රශංසා අපේක්ෂාවෙන් සමාදන් වන ලද ශීලයක් නො වන්නේ ය. චක්‍රවර්ති සම්පත්, ශක්‍ර දිව්‍යරාජ සම්පත්, බ්‍රහ්මරාජ සම්පත් ආදි වූ ද දිව්‍ය-මනුෂ්‍ය-බ්‍රහ්ම සංඛ්‍යාත ලෞකික භව සම්පත් පිණිස සමාදන් වන ලද ශීලයක් නොවන්නේ ය. මෙසේ තෘෂ්ණාවට වහල් නො වී රක්නා ලද මාගේ ශීලය 'භුජිස්ස' ශීලයකි. තෘෂ්ණා දාසභාවයෙන් මිදුනා වූ මාගේ ශීලය වනාහි, නිවැරදි ශීලයකි. ඍජු ශීලයකි. කුසල ශීලයකි. පිරිසිදු ශීලයකි. නිවැරදි වූ ඍජු වූ කුසල් වූ පිරිසිදු වූ මාගේ ශීලය උපචාර සමාධි, අර්පණා සමාධි, මාර්ග-ඵල සමාධි දක්වා ආනිසංස ඵල ගෙන දීමට සමර්ථ වන්නේ ය. සාධු**!** සාධු**!** සාධු**!**

**6.** සාධු**!** සාධු**!** අනන්තාපරිමාණ බුදු, පසේබුදු, මහරහතන් වහන්සේලා අනු ව යමින් මාර්ග, ඵල, නිවන් සුව පිණිස මා විසින් සමාදන් ව රක්නා ලද ශීලය බුදු, පසේබුදු, මහරහතන් වහන්සේලා වැනි මහෝත්තමයන් වහන්සේලා විසින් ද සමාදන් ව රකිනා ලද්දේ ය. පුරන ලද්දේ ය. ප්‍රශංසා කරන ලද්දේ ය. අනුමෝදන් වන ලද්දේ ය. එවැනි මහාප්‍රාඥයන් විසින් ද කරුණු සහිත ව දක්වීමට වරදක් නැත්තා වූ මාගේ ශීලය 'විඤ්ඤූප්පසත්ථ' ශීලයකි. 'විඤ්ඤූප්පසත්ථ' වූ මාගේ ශීලය වනාහි, නිවැරදි ශීලයකි. ඍජු ශීලයකි. කුසල ශීලයකි. පිරිසිදු ශීලයකි. නිවැරදි වූ ඍජු වූ කුසල් වූ පිරිසිදු වූ මාගේ ශීලය උපචාර සමාධි, අර්පණා සමාධි, මාර්ග-ඵල සමාධි දක්වා ආනිසංස ඵල ගෙන දීමට සමර්ථ වන්නේ ය. සාධු**!** සාධු**!**

**7.** සාධු**!** සාධු**!** අනන්තාපරිමාණ බුදු, පසේබුදු, මහරහතන් වහන්සේලා අනු ව යමින් මාර්ග, ඵල,

නිවන් සුව පිණිස මා විසින් සමාදන් ව රක්නා ලද ශීලය චාතුර්මහාරාජික, තාවතිංස, යාම, තුසිත, නිර්මාණරතී, පරනිර්මිතවසවර්ති නම් වූ සදිව්‍යලෝක සම්පත් පිණිස සමාදන් වන ලද ශීලයක් නො වන්නේ ය. ක්‍ෂත්‍රිය, බ්‍රාහ්මණ, ගෘහපති, මහාසාර කුල-සම්පත්, ධන-සම්පත්, යශ, ඓශ්වර්ය, පරිවාර සම්පත් පිණිස රක්නා ලද ශීලයක් ද නො වන්නේ ය. මෙම ශීලයෙන් ම, ව්‍රතයෙන් ම සංසාර ශුද්ධිය වන්නේ ය යි මිථ්‍යාදෘෂ්ටියෙන් රක්නා ලද ශීලයක් ද නො වන්නේ ය. හේතු කරුණු සහිත ව දෙස් දක්වන්නා වූ අන්‍යයන්ගේ ග්‍රහණයට වැටෙන්නා වූ අවිශුද්ධ ශීලයක් ද නො වන්නේ ය. මෙසේ තෘෂ්ණා දෘෂ්ටීන්ගෙන් පරාමර්ශනය නො වූ මාගේ ශීලය 'අපරාමට්ඨ' ශීලයකි. 'අපරාමට්ඨ' වූ මාගේ ශීලය වනාහි, නිවැරදි ශීලයකි. සෘජු ශීලයකි. කුසල ශීලයකි. පිරිසිදු ශීලයකි. නිවැරදි වූ සෘජු වූ කුසල් වූ පිරිසිදු වූ මාගේ ශීලය උපචාර සමාධි, අර්පණා සමාධි, මාර්ග-ඵල සමාධි දක්වා ආනිසංස ඵල ගෙන දීමට සමර්ථ වන්නේ ය. සාධු! සාධු! සාධු!

**8.** සාධු! සාධු! අනන්තාපරිමාණ බුදු, පසේබුදු, මහරහතන් වහන්සේලා අනු ව යමින් මාර්ග, ඵල, නිවන් සුව පිණිස මා විසින් සමාදන් ව රක්නා ලද ශීලය, අඛණ්ඩ, අච්ඡිද්ද, අසබල, අකම්මාස, භුජිස්ස, විඤ්ඤුප්පසත්ථ, අපරාමට්ඨ ගුණයෙන් සමන්වාගත බැවින් ඒකාන්තයෙන් ම සමාධි 'සංවත්තනික' නම් වන්නේ ය. පිරිසිදු ව රක්නා ලද මාගේ සීලය වනාහි ධ්‍යානෝපචාර සමාධි, විදර්ශනෝපචාර සමාධි, මාර්ගෝපචාර සමාධි, පිණිස ද පවත්නේ ය. දස කසිණ අර්පණා සමාධි පිණිස ද වන්නේ ය. දස අශුභ අර්පණා සමාධි පිණිස ද වන්නේ ය. ආනාපානසති, කායගතාසති අර්පණා සමාධි පිණිස ද වන්නේ ය. බ්‍රහ්මවිහාර අර්පණා සමාධි පිණිස ද වන්නේ ය. අරූප ධ්‍යාන අර්පණා සමාධි පිණිස ද වන්නේ ය. මාර්ග ඵල අර්පණා සමාධි පිණිස ද වන්නේ ය. සමාධි සංවත්තනික වූ මාගේ ශීලය වනාහි, නිවැරදි ශීලයකි. සෘජු ශීලයකි. කුසල ශීලයකි. පිරිසිදු ශීලයකි. නිවැරදි වූ සෘජු වූ කුසල් වූ පිරිසිදු වූ මාගේ ශීලය උපචාර සමාධි, අර්පණා සමාධි, මාර්ග-ඵල සමාධි දක්වා ආනිසංස ඵල ගෙන දීමට සමර්ථ වන්නේ ය. සාධු! සාධු! සාධු!

## විදර්ශනාවට නැංවීම

සීලානුස්සති භාවනාවේ දී පහළ වූ නාම-රූප ධර්මයෝ මොහොතක් මොහොතක් පාසා ඇති ව නැති ව ගිය බැවින් අනිත්‍යයෝ ය. ඇති වීම් නැති වීම් දෙකින් පීඩා වින්ද බැවින් දුක්ඛයෝ ය. කැමති කැමති ලෙස නො පැවති බැවින් අනාත්මයෝ ය. මාගේ මෙම සීලානුස්සති භාවනාව වහා සසරින් එතෙර වීම සඳහා ම හේතු වාසනා වේවා!

**ප්‍රාර්ථනාව:** මෙම ධර්මදානමය කුසලය ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ අපවත් වී වදාළ සියලු ම ස්වාමීන් වහන්සේලාට අත්පත් වේවා! එසේ ම අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරන්නා වූත් භාවනා කර්මස්ථාන ලබා දෙමින් භාවනා උපදෙස් දෙන්නා වූත් මහාකම්මට්ඨානාචරිය අතිපූජනීය නා උයනේ අරියධම්ම ස්වාමීන්ද්‍රයන් වහන්සේ, අතිගරු ගලගෙදරගම බෝධිධම්ම ස්වාමීන් වහන්සේ, පූජ්‍ය නාවල ධම්මානන්ද ස්වාමීන් වහන්සේ ඇතුළු සියලු ම ස්වාමීන් වහන්සේලාටත් නිදුක් නිරෝගි සුවය ලැබී තව තවත් බොහෝ දෙනාට සසර කතරින් එතෙර වීමට මාර්ගය පාද දෙමින් එම ස්වාමීන් වහන්සේලා ප්‍රාර්ථනා කරන උතුම් බෝධියකින් නිර්වාණ ශාන්තිය සාක්ෂාත් කර ගැනීමට ද මෙම ධර්මදානමය කුසලය හේතු වාසනා වේවා! අභාවප්‍රාප්ත මවුපිය, ඥාතිමිත්‍රාදි සියලු දෙනාටත් මේ පින් එක සේ අත්වීමෙන් සසර දුකින් එතෙර ව නිවන් සුව ලබත්වා!

සාධු ! සාධු !! සාධු !!!

ශ්‍රී සද්ධර්ම සංසදය
ධම්මාරාම යෝගාශ්‍රමය
(මැදින් 2550)


**ආශ්‍රිත ග්‍රන්ථ:**

✍ සමසතළිස් කර්මස්ථාන භාවනා - අතිපූජනීය නා උයනේ අරියධම්ම ස්වාමීන්ද්‍රයන් වහන්සේ



**ධර්මදානය:** පින්වත් සිරිපාල උපාසක මහතා හා මාලනී උපාසිකා මාතාව විසින් හා ගොතටුව නව නගරයේ පින්වත් උපාසක - උපාසිකා පිරිස විසින් නිවන් පතා මෙම ධර්මදානය සිදු කරන ලදී.


❖ *අතිපූජනීය නා උයනේ අරියධම්ම ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ධර්ම දේශනා ඇතුළු පටිගත කරන ලද ධර්ම දේශනා සහ පසුගිය දහම් ලිපි* **www.sadaham.net** *යන වෙබ් අඩවිය ඔස්සේ ලබාගත හැකි ය.*


Copyright © Sri Saddharma Sansadaya, Dhammarama Yogashramaya - 2006